# තුප්පහියන්ගේ පව ගෙවීමට සිදුවීම

පිලිප් ගුණවර්ධන මහතා වරක් සමසමාජ පාක්ෂිකයෙකු වූ ඩොරික් ද සූසා මහතා හැඳින්වූයේ තුප්පහියකු ලෙසය. තුප්පහියා යන්න පෘතුගීසි වචනයකින් බිඳී ආවක් යැයි කියැවෙයි. එහි තේරුම පරිවර්තකයා යැයි ද පැවසෙයි. ඒ කෙසේ වුවත් අද ව්‍යවහාරයෙහි එතරම් නැති මේ වදනින් ටික කලකට උඩඳී හඳුන්වනු ලැබුයේ සංකරයා, බටහිර සිරිත් විරිත් අනුකරණය කරන්නා ආදීන් යැයි කිවහැකිය. තුප්පහියා යන්න නිර්වචනය කිරීම අනවශ්‍ය යැයි මම සිතමි. මේ ලිපිය තුළ තුප්පහියා යනුවෙන් හඳුන්වනු ලබන්නේ කවරකුද යන්න ලිපියෙන් ම පැහැදිලි වනු ඇත. එසේ පැහැදිලි නොවන තැනැත්තකු සිටී නම් ඒ තුප්පහියකුම විය යුතුය.

තුප්පහියන් සිටින්නේ ඉංග්‍රීසි කතා කරන අය අතර පමණක් නොවේ. සිංහල කතා කරන තුප්පහියෝද වෙති. සුව කළ නොහැකි හීනමානයකින් පෙළෙන එක්ස් කණ්ඩායම එයට නිදර්ශනයකි. තුප්පහියන් ඇත්තේ ධනපතියන් අතර පමණක් නෙවේ. ඊනියා සමාජවාදීන් අතර ද තුප්පහියෝ වෙති. සමාජවාදීන් යැයි කියාගන්නවුන් අතර වූ තුප්පහියෝද වෙනත් තුප්පහියන් ද සමඟින් දෙමළ ජාතිවාදයට ආධාර කරති. එයට උඩගෙඩි දෙති. තුප්පහියන් කොහේ සිටියත් ඔවුහු විජාතික පන්තියට අයත් වෙති. තුප්පහියන්ගේ ප්‍රධාන ලක්ෂණ දෙකක් වෙයි. එකක් පහළොස් වැනි සියවසේ ඇරඹී බටහිර නූතනත්වයට නැත්නම් ඊනියා පශ්චාත්නූතනත්වයට යට වී එය කරපින්නා ගැනීම හා අනුකරණය කිරීමය. දෙවැන්න අපේ දේ ගැරහීමය. ඔවුන් පැරණි සිංහලයන්ගේ නිර්මාණ අගය කරන්නේ නම් ඒ ඓතිහාසික වශයෙනි. සමාජ විකාශය තුළ එක් කාලයක ඊනියා මානවයා විසින් කරන ලද නිර්මාණ ලෙස සලකා තුප්පහියෝ ඒ අගය කරති. මේ අතර වික්‍රමබාහු කරුණාරත්න වැනනෝ තමන් නොදන්නා පටිච්චසමුප්පාද, පුනබ්භව ගැන ලියමින් තමන් ඒවා දන්නා බවත් අගය කරන බවත් පෙන්වීමට උත්සාහ කරති. ඔහු වරක් අනිත්‍ය යථාර්ථය බව පෙන්වීමට උත්සාහ ගත්තේය. සියල්ල විනාශ වන්නේ නම් පුනබ්භවයක් තිබෙන්නේ කෙසේ දැයි ඔහු අසන්නේ ඊනියා අපෝහකය ගැනද වැටහීමකින් තොරවය. ඔහු ඊනියා අපෝහකය ගැන දන්නා තරම දයාරත්න රණතුංග මහතා සංගීතය ගැන ලියා ඇති වාක්‍යයකට කරන අර්ථ විවරණයෙන් පැහැදිලි වෙයි. මොවුන් දන්නා එකම අපෝහකය කබරගොයා තලගොයා කර ගැනීමය. තුප්පහියන්ට අවශ්‍ය කරන්නේ තමන් කොතැනක සිටියද අප ඊනියා ශිෂ්ටයන් කිරීමය. එහි පළමු උපකල්පනය නම් අප අශිෂ්ටයන් යන්නය. මේ අතර ඊනියා විදග්ධ තුප්පහියෝ ප්‍රශ්න ද අසති. අපේ දේ හඳුනාගන්නේ කෙසේ දැයි ඔවුහු අසති. අද අප අපේ කියන ඇතැම් දෑ අපට ලැබුණේ පිටින් නොවේදැයි ඔවුහු දැන මුත්තන් ලෙස අසති. අපට බුදු දහම පවා ලැබුණේ පිටින් නොවේදැයි ඔවුහු ප්‍රශ්න කරති.

මේ ප්‍රශ්නවලට පිළිතුරු දීම අමාරු දෙයක් නොවේ. පිටින් ගත් දෑ අපේ දෑ බවට පත් කර ගන්නේ ඒවා අවශෝෂණය කර ගැනීමෙනි. තුප්පහියන් දන්නේ අනුකරණය පමණකි. එබැවින් ඔවුන් සමග අවශෝෂණය ගැන කතා කිරීමෙන් එතරම් පළක් නැත. ජනමාධ්‍යවලට රිංගාගත් ඊනියා කටකාර, හැඩකාර, බුද්ධිමත් තුප්පහියන් පමණක් නොව එහි ලොක්කන් වූ මහාචාර්ය තුප්පහියන් දන්නේද අනුකරණය පමණකි.

අද තුප්පහියෝ ලෝක බොරුවකින් අප රවටති. විශ්වවිද්‍යාලවලින් පිටවෙන උපාධිධාරීන්ට රැකියා නැත්තේ ඔවුන් ඉංගිරිසිය හා පරිගණක ශිල්පය නොදන්නා බැවින් යැයි තුප්පහියෝ අපට කියති. මේ රටේ ඉංගිරිසිය, පරිගණක ශිල්පය හා අවශ්‍ය නම් කළමනාකරණය දන්නා උපාධිධාරීන් කී දෙනෙකුට රැකියා සැපයිය හැකි දැයි මේ තුප්පහියන් අපට කියන්නේද? තිබෙන රැකියා සංඛ්‍යාව කීමට මොවුන්ට නොහැකිය. නියම තත්ත්වය නම් එවැනි රැකියා එතරම් ප්‍රමාණයක් නොමැති බවය. සියලුම උපාධි අපේක්ෂකයන්ට නොව ඔවුන්ගෙන් පන්දහසකට පරිගණක ශිල්පය හා ඉංගිරිසිය ඉගැන්වූවහොත් ඔවුන්ට දීමට රැකියා පුද්ගලික අංශය යැයි කියන අංශයේවත් නැත. ඊනියා රාජ්‍ය අංශය ගැන කතා කිරීමෙන් වැඩක් නැත. කලක් මේ රටේ කලිසම් ඇඳි අයට ඊනියා තත්ත්වයක් තිබුණි. අද සියල්ලෝම පාහේ කලිසම් අඳිති. එබැවින් අද ඊනියා තත්ත්වයක් ලබා ගැනීමට නම් අඩුම තරමින් කර පටියක්ද බැඳගත යුතුය. නැත්නම් ශ්‍රී අංක තහඩුව නැති, ඉංගිරිසි අකුරු සහිත අංක තහඩුවක් ඇති මෝටර් කාරයක, වෑන් රථයක ගමන් කළ යුතුය. සාමාන්‍ය කලිසමක් ඇඳ බසයේ ගමන් කරන්නාට කලිසම අඳින කොන්දොස්තර දෙවියාගේ පිහිටිය. අප්‍රිකාවේ බොහෝ රටවල ඉංගිරිසි කතා කරන්නෝ රැකියා පෝලිමේ ඉංගිරිසියෙන් කතා කරති. මේ රටේ කළමනාකරණය කිරීමට තරම් ආයතන තිබේද? භෞතික විද්‍යාව හදාරා පිටවන උපාධිධාරියෙකුට රැකියා නැත්තේ

© Prof. Nalin De Silva

ඔහු කළමනාකරණය නොදත් නිසා ඉංගිරිසි නොදත් නිසා හෝ එසේත් නැත්නම් ඊනියා පෞරුෂය නැති නිසා හෝ නොව භෞතික විද්‍යාව හැදෑරූ අයෙකුට කරන්නට හැකි රැකියා මෙරට එතරම් නොමැති වීම නිසා ය. මේ රටේ භෞතික විද්‍යාව පදනම් කරගත් කර්මාන්ත කෙතරම් තිබේදැයි තුප්පහියෙකු ඉංගිරිසියෙන් හෝ ගණන් කර කියන්නේද? අද භෞතික විද්‍යාව හැදෑරූ අයකු එක්කෝ වෙනත් රටකට යා යුතුය. නැත්නම් භෞතික විද්‍යාව ඉගැන්විය යුතුය. භෞතික විද්‍යාව හැදෑරූ අයකුට මෙරට රැකියාවක් නොමැතිව වුවද ඇතැම් විට පිටරට රැකියාවක් ලබාගත හැක්කේ කෙසේද ? ඒ අයගේ පෞරුෂය මෙරටට ප්‍රමාණවත් නොවුණද පිටරටට ප්‍රමාණවත් නිසාද ? අප සරසවි සිසුන්ව සිටි සමයේ අප මිතුරෝ කිහිපදෙනෙක් ඊනියා පෞරුෂය ඇතැයි කී තුප්පහියන් නියැදියක් තෝරා පෞරුෂය ඇත්තේ කොහේදැයි දැන ගැනීමට සමීක්ෂණයක් කළහ. ඔවුන් ලබාගත් නිගමනය ප්‍රකාශ කිරීමට දිවයින ඉරිදා සංග්‍රහයෙහි කර්තෘතුමා අවසර නොදෙයි. පෞරුෂය වර්ධනය නරක යැයි මම නොකියමි. එහෙත් ඉන් රටට වැඩක් වේ යැයි මම නොසිතමි. මේ රටේ තුප්පහියන්ට ඊනියා නිදහසින් පසුවදා මෙරටට සුදුසු ආර්ථිකයක්, රැකියා ව්‍යුහයක් හා අධ්‍යාපන ක්‍රමයක් ඇති කර ගැනීමට නොහැකි වී ඇත. ඒ පවට කර ගැසිය යුත්තේ මේ රටේ දරුවන් වීම කෙතරම් අභාග්‍යයක්ද? අධ්‍යාපනයේ කෙතරම් දුර්වලකම් තිබුණද උසස් පෙළ සමත්වන සියලු සිසුන්ට විශ්වවිද්‍යාවලට ඇතුළත්වීමට නොහැක්කේ අවශ්‍ය තරම් විශ්වවිද්‍යාල නොමැති බැවින්ය. විශ්වවිද්‍යාලවලින් පිටවන උපාධිධාරීන්ට රැකියා නැත්තේ අවශ්‍ය තරම් රැකියා නොමැති බැවින්ය. ඒ හැරෙන්නට මෙහි මහාප්‍රාණයක් නැත.

මෙරට ඇතැයි කියන ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයටද බටහිරයන් හා දෙමළ ජාතිවාදීන් හැරුණු කොට වග කිව යුත්තේ සිංහල නමින් පෙනී සිටින තුප්පහියන් බව පැහැදිලිය. එකළ විසූ සිංහල තුප්පහියෝ ඉංගිරිසි පමණක් කතා කළහ. ඔවුන් බොහෝ දෙනෙකුට රට ජාතිය ආගම පිළිබඳව අදහසක් නොතිබිණි. එහෙත් ඉංගිරිසි කතා කළ දෙමළ නායකයෝ එසේ නොවූහ. ඔවුහු ඉංගිරිසිත් සමඟ එක් වී තුප්පහි සිංහල නායකයන් පරාජය කළහ. ඉංගිරිසි කතාකළ නිවට නායකත්වය නිසාම බොහෝ අවස්ථාවල සිංහලයෝ පරාජය වූහ. ඉංගිරිසි කතාකළ දෙමළ නායකයන්ට අවශ්‍යවූයේ මුළු රටේම නායකයන් බවට පත්වීමය. සර්වජන ඡන්දයත් සමඟ මේ තත්ත්වය දිගටම ගෙන යෑමට දෙමළ නායකයෝ අපොහොසත් වූහ. ඒ බව තේරුම් ගත් චෙල්වනායගම් නම් අන්ත දෙමළ ජාතිවදයා වෙනම පක්ෂයක් ඉලංකෙයි තමිල් අරසු කච්චි හෙවත් දෙමළ රාජ්‍ය පක්ෂය නමින් පිහිටුවා උතුර හා නැගෙනහිර පළාත්වලට පළමුව ඊනියා ෆෙඩරල් ක්‍රමයක් ලබා ගැනීමට උද්ඝෝෂණය කළේය. ටික කලෙකින් ම ඒ පළාත්වල පාලන බලය හෙවත් වෙනම රාජ්‍යයක් වෙනුවෙන් චෙල්වනායගම් කටයුතු කිරීමට පටන් ගත්තේය. 1956 දී සර්වජන ඡන්දයෙන් ආරම්භ වූ ක්‍රියාදාමය තව දුරටත් වෙනස් වීමට පටන් ගැණුනි. ඒ බව අධ්‍යයන කළ සිංහල විරෝධීහු ජාතිකත්වය පරාජය කිරීමට උපක්‍රම සෙවූහ. මේ උපක්‍රම විවිධය. ලෝකය පුරාම පටන්ගෙන තිබූ ඊනියා රාජ්‍ය නොවන සංවිධාන ලංකාවේ ද පිහිටුවන ලදී. සර්වෝදය හා මාර්ග ආයතන ඉන් දෙකක් විය. 1978 න් පසුව සිංහල විරෝධීහු රාජ්‍ය අනුග්‍රහ සහිතව ඉදිරියට පැමිණියහ.

ඉතිහාසය මෙරට ඉගැන්වීම නතර කරන ලද්දේ 1978 ටද පෙර බදියුද්දීන් ඇමැතිවරයා විසිනි. ලෝකයේ පැරණිම ඉතිහාසයක් තිබෙන රටවල් හා ජාතීන් දෙකෙන් එකක් වුවද (අනෙක් ජාතිය චීන්නු වෙති) අද සිංහලයාට ඉතිහාසයක් නැති කර ඇත. අපේ වංශ කතා විශ්වාස නොකළ හැකි දේ බවට තුප්පහින්ට ඒත්තු ගන්වා ඇත. අද ඉතිහාසය ඉගැන්වීමට තුප්පහියෝ බිය වෙති. සිංහල ඉතිහාසය මෙන්ම දෙමළ ඉතිහාසයක්ද ඇතැයි ඔවුහු කියති. පිළිගත යුත්තේ කුමක්දැයි අසති. අද එංගලන්තයේ ඉතිහාසය ගැන ඔවුන්ට සැකයක් නැත. ඊනියා ඉන්දියානුවන් මුළුමනින්ම මෙන් වදකර බලයට පත්වූ ඇමරිකන් ජාතිකයන් ඇමරිකන් ඉතිහාසය ලෙස උගන්වන්නේ ඇමරිකන් ඇංග්ලෝ සැක්සන් සුද්දන්ගේ ඉතිහාසය මිස වෙනත් ඉතිහාසයක් නොවේ. ලන්දේසි යුගයට පෙර මෙරට ලියැවුණු දෙමළ ඉතිහාසයක් නැත. පළමු දෙමළ ඉතිහාස පොත ලියැවුණේ ලන්දේසි නිලධාරියකුගේ ආරාධනයෙනි. එහෙත් මෙරට ඉතිහාසය සිංහල ද අරක ද මේකද යනුවෙන් ප්‍රශ්න ඇති කෙරෙයි. මෙහි තේරුම නම් දෙමළ ඉතිහාසයක් නැති නිසාද වෙනත් හේතුන් නිසාද සිංහලත්වයට හිමි තැන අහිමි කිරීමය. සිංහල තුප්පහි නායකයන්ගේ දුර්වල කම නිසා මෙය මෙසේ සිදුවෙයි.

උතුරු මැද පළාතේ නොව යාපන අර්ධද්වීපයෙහිද, නටබුන්වලින් පෙන්වන්නේ සිංහල බෞද්ධ ඉතිහාසයක් මිස අනෙක් ඉතිහාසයක් නොවේ. මුස්ලිම් පල්ලිවලට වුවද අවුරුදු දෙසීයයකට වඩා වයසක් නැත. මෙරට ඉතිහාසයක්

© Prof. Nalin De Silva

සංස්කෘතියක් ගොඩා නගා ඇත්තේ සිංහලයන් වුවද, තුප්පහියෝ ඒ ඉතිහාසය වැරදි ලෙස ප්‍රශ්න කරති. එමගින් ජනාතාව තුළ සැකය ඇති කරති. මෙරට දෙමළ ඉතිහාසයක් ඇත්තේ යාල්පාන වෛපම මාලෙයි නමැති කවි පොත ලන්දේසි යුගයේදී ලියැවීමත් සමගය. මේ ඊනියා දෙමළ ඉතිහාසය තුළ බොහෝ අසත්‍ය ප්‍රචාර වෙයි. ඒ අතර ඊනියා නිජ භූමි සංකල්පය සාක්ෂාත් කරගැනීම සඳහා 1976 න් පසු ව ලියැවුණු ඉතිහාසයක් වෙයි. සිංහල ඉතිහාසය සැක කිරීමේ කාර්යය සඳහා පේරාදෙනියේ ලෙස්ලි ගුණවර්ධන ආදීහු ද කටයුතු කළහ.

තම්බයියාලා එච්. එල් සෙනෙවිරත්නලා බටහිර සමාජ විද්‍යාව ඔස්සේ සිංහලයන්ට හිමි තැන අහිමි කිරීමට ක්‍රියා කළහ. මෙරට ලියැවුණු දෙමළ සම්භාව්‍ය සාහිත්‍ය කෘති එකක්වත් නැත. සලප්පදිකාරම් වැනි කෘතී දෙමළ වුවද ඒවා දකුණු ඉන්දියාවේ නිර්මාණ වෙයි. ඔය කියන තරම් ඉතිහාසයක් මෙරට දෙමළ ජනයාට ඇත්නම් එක් සම්භාව්‍ය දෙමළ කෘතියක් ලංකාවේ නිර්මාණය නොවුයේ ඇයි?

තම ඉතිහාසය සැක කරන ජාතියක් සිංහලයන්, එනම් එහි ඊනියා නායකයන් වූ තුප්පහියන්, හැරෙන්නට ලොවේ වෙනත් නැත. සිංහල ඉතිහාසය නැති කිරීමට බටහිරයෝ දෙමළ ජාතිවාදී ඉතිහාස, සමාජ විද්‍යා, ආර්ථික උපදෙස් පමණක් නොව අධිකරණ උපදෙස්ද දීමට මග බලා සිටිති. අද නෝර්වේ අගමැතිද ලංකාණ්ඩුවට ඊනියා උපදෙස් දෙයි. මේ උපදෙස් පිළිගන්නේ අධ්‍යාපනය හා සංස්කෘතියෙන් බටහිරයන් අනුකරණය කරන තුප්පහියන් පිරිසකි. ලෝකයේ අනෙක් රටවල ඉතිහාසය උගන්වද්දී අපි තුප්පහි නායකයන් නිසා ඉතිහාසය ඉගැන්වීමට බියෙන් සිටිමු. අපේ ඉතිහාසය නොදැන බිහිවන පරම්පරාවක් අතින් අපේ වූ දැනුමක් බිහිවේද? ඉතිහාසය ගැන සැක කිරීමට ඉගැන්වීමෙන් තුප්පහියෝ තම දෙමව්පියන් නොහඳුනන තත්ත්වයකට පත්වී සිටිති. එක්ස් කණ්ඩායමේ නිර්මාල් දේවසිරි ඉතිහාසය දැනගන්නේ කෙසේ දැයි ප්‍රශ්න කර නැත. ඔහුගේ තකතීරු තර්කය අනුව අප එකල නොසිටි නිසා අපට ඉතිහාසය දැන ගැනීමේ ක්‍රමයක් නැත. ඒ තර්කය අනුව ලොවෙ කිසිම ඉතිහාසයක් දැන ගැනීමට පමණක් නොව අම්ම තාත්තා දැනගැනීමටද හැකි කමක් නැත. එපමණක් නොව තමන් අත් නොවිඳි කිසි දෙයක් දැන ගැනීමට ද නොහැකි ය. ඉන්දියානු භූතවාදයෙන් ගලා එන මේ සියලු තර්ක විතර්ක ගෙනෙන්නේ සිංහලයන් අතර සැක ඇති කිරීම සඳහාය. දෙමළ ජනයා අතර ඉතිහාසය සැක කිරීම සඳහා ව්‍යාපාරයක් නැතිවා පමණක් නොව ඔවුන් ලියා ඇති කිසිම ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක හෝ සාධකයක් සමග සංගත නැති ඉතිහාසය ප්‍රචාරය කිරීමේ ව්‍යාපෘතියක්ද වෙයි.

දෙමළ ජාතිවාදය ඇරඹුණේ ඉංගිරිස් කතා කරන දෙමළ ජනයාට ඉංගිරිසි කතාකරන සිංහලයන් පරදවා රටේ නායකත්වය ලබාදීමටය. බ්‍රිතානීන්ට එහිදී දෙමළ ජාතිවාදය පෝෂණය කිරීමට හැකි වූයේ බ්‍රිතානි සමය තුළම වරප්‍රසාද දීමෙන් ජන අනුපාතයට කෙසේවත් සම නොවන ආකාරයකින් ඉංගිරිසි කතාකරන දෙමළ පිරිසක් බිහිකර තිබූ හෙයිනි. කොළඹට පැමිණි මේ ඉංගිරිසි කතාකරන දෙමළ පිරිස ඉංගිරිසි කතාකරන සිංහලයන්ට අභියෝග කරමින් බ්‍රිතානීන් හා එක්ව කටයුතු කළහ. 1956 න් පසු ඔවුන් එතෙක් අයථා ලෙස විඳි වරප්‍රසාද නැතිවන විට එය දෙමළ ජනයාට එරෙහි ව සිදු කෙරෙන අසාධාරණයක් ලෙස අර්ථකථනය කෙරිණි. ඉංගිරිසි කතා කරන දෙමළ ජනයාගේ සිංහල විරෝධී ව්‍යාපාරය අද දෙමළ කතාකරන ප්‍රභාකරන් තම අතට ගෙන ඇත. ඔහුට බටහිර රටවල ආධාර ලැබෙන්නේ ඔහුගේ සිංහල විරෝධය නිසාය. ඉංගිරිසි කතා කරන හා කතා නොකරන සිංහල නමින් පෙනී සිටින තුප්පහියෝ අද බටහිරයන් හා දෙමළ ජාතිවාදය ඉදිරියේ දණින් වැටෙති. මේ නිවට තුප්පහියන්ගේ පව්වලට කර ගැසීමට සිදුවන්නේ අහිංසක සිංහලයන්ටය. සිංහලයන් නිදහස් වීමට නම් පළමුව ඔවුන් මේ නිවට දේශපාලන හා ඊනියා ශාස්ත්‍රීය තුප්පහියන්ගෙන් නිදහස් විය යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva